# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2085/1 - 2018 අගෝස්තු මස 20 වැනි සඳුදා - 2018.08.20**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

### ජනාධිපති විධානය

රාජ්‍ය අංශයේ දැනට පවත්නා වැටුප් ව්‍යුහයන් පිළිබඳ අධ්‍යයනය කිරීමත්, සමස්ත රාජ්‍ය සේවය තුළ හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම් වල කාර්ය මණ්ඩලයන්හි විවිධ සේවාවන්ගේ කාර්යභාරය හා වගකීම් ස්වභාවය සම්බන්ධයෙන් විධිමත් ඇගයීමක් තුළින් එක් එක් සේවාවන්හි වැටුප් විෂමතාවය අවම කිරීමත්, ශ්‍රම වෙළඳපොල තුළින් සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමටත්, රඳවා තබා ගැනීමටත් හැකිවන ආකාරයෙන් වැටුප් විෂමතා රහිත ප්‍රශස්ත වැටුප් ව්‍යුහයක් රාජ්‍ය අංශය වෙත ලබා දීමත්, සඳහා අවශ්‍ය වන නිර්දේශ ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ 2 වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් විශේෂ නියෝජිතායතනයක් ස්ථාපනය කිරීම.

1 එස්. රනුග්ගේ මැතිතුමා
2 කේ. එල්. එල්. විජේරත්න මැතිතුමා
3 ටී. පී. කොල්ලුරේ මැතිතුමා
4 සී. පී. සිරිවර්ධන මැතිතුමා
5 සුධර්මා කරුණාරත්න මැතිතුමිය
6 ජනක සුගතදාස මැතිතුමා
7 ධාරණී එස්. විජේතිලක මැතිතුමිය
8 ලලිත් ආර්. ද සිල්වා මැතිතුමා
9 ජී. එස්. එදිරිසිංහ මැතිතුමා
10 ඒ. ආර්. දේශප්‍රිය මැතිතුමා
11 බී. පී. පී. එස්. අබේගුණරත්න මැතිතුමිය
12 වෛද්‍ය පාලිත අබේකෝන් මැතිතුමා
13 පී. තංගමයිල් මැතිතුමා
14 එස්. ඩී. ජයකොඩි මැතිතුමා
15 එම්. සී. වික්‍රමසේකර මැතිතුමා


1A - G 27787 — 32 (2018/08)

සැ.යු. :- අති විශෙෂ ගැසට් අංක 2084/1 අංක 2084/66 න් අවසන් වේ.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත,
සුභාශිංසන පෙරටුවයි !

යහපත් වූ රාජ්‍ය පාලනයක් තුළ ජනතාවගේ අභිලාෂයන් යථා පරිදි මුදුන්පත් කිරීම උදෙසා රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් සමස්ත රාජ්‍ය අංශයෙහි වැටුප්, වේතන ඇතුළු සියලු පාරිශ්‍රමික ව්‍යුහයන් සමාලෝචනය කරමින් සමස්ත රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ශ්‍රමබල අවශ්‍යතාවයන් යෝග්‍ය පරිදි සපුරාලීම පහසුකරලීම සඳහා කාර්ය මණ්ඩල අධ්‍යයනයක් සිදුකොට ඊට උචිත වනසේ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් ලබා දීම සහ සහාය වීම පිණිස ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව පිහිටුවා ඇතත් තවදුරටත් රාජ්‍ය අංශයේ වැටුප් සම්බන්ධයෙන් විශේෂයෙන් දුම්රිය, තැපැල්, සෞඛ්‍ය වැනි වෘත්තීය සමිති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන සේවාවන්හි මෙන්ම දීපව්‍යාප්ත සේවාවන්හිද වැටුප් ව්‍යුහයන්වල ඇති අසමානතාවයන්, විෂමතාවයන් හා නොගැලපීම් හේතුවෙන් උද්ගත වී තිබෙන අසහනකාරී තත්ත්වයන්ට පාදක වූ කරුණු විශ්ලේෂණය කොට ඉතා කඩිනමින් විසඳුම් ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ලබාගැනීමට රජය අපේක්ෂා කරයි.

ඒ අනුව, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින්, රාජ්‍ය අංශයේ වැටුප් අධ්‍යයනයන් හා සමාලෝචනයන් තුලින් අවස්ථාවෝචිත පරිදි මේ දක්වා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කරමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016, ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කරමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ, සහ විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සංශෝධනය කරමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ 04/2016, ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයන්ගේ වැටුප් සංශෝධනය කරමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2016, 03/2017, 01/2018, 02/2018, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කරමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2016 යන චක්‍රලේඛ නිකුත් කර ඇති බව සැලකිල්ලට ගනිමින් ද,

තවද මේ ආකාරයෙන් විවිධ අවස්ථාවන්හිදී එක් එක් සේවාවන්හි සිදු කරන ලද වැටුප් වැඩිකිරීම් හේතුවෙන් අනිකුත් සේවාවන්ද ඊට සමානුපාතිකව සිය වැටුප් හා දීමනා වැඩිකරන ලෙස ඉල්ලමින් ගනු ලබන වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් පැනනැගී ඇති අසහනකාරී තත්ත්වයන් හා ඊට සමගාමීව රාජ්‍ය සේවයෙහි ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේදී කාර්යක්ෂමතාවය කෙරෙහි ඇතිකරන අහිතකර බලපෑම හා මූල්‍යමය වශයෙන් රජයට දැරීමට සිදුවන ආර්ථික පිරිවැය සැලකිල්ලට ගනිමින්ද,

තවද, ශ්‍රී ලංකා මහ බැංකුව ද, රාජ්‍ය බැංකු ද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි විශාල රාජ්‍ය ව්‍යාපාර, සාමූහික ගිවිසුම් මත 20% - 25% ක ප්‍රතිශතයකින් වසර තුනකට වරක් ඔවුන්ගේ වැටුප් හා සියළුම දීමනා වැඩිකර ගැනීම හා එතුලින් ඒ හා සමාන කාර්යන්හි නිරතව සිටින රජයේ සේවයේ කාර්ය මණ්ඩල හා සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම් හා රාජ්‍ය බැංකුවල කාර්ය මණ්ඩල මාසිකව අතට ලබන වැටුප් (Take home salary) අතර විශාල අසමානතාවයක් නිර්මාණය වී තිබීම සැලකිල්ලට ගනිමින්ද,

තවද, සාමූහික ගිවිසුම් මත ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල කාර්ය මණ්ඩලවලට ලැබෙන ඉහළ පාරිශ්‍රමික සැලකිල්ලට ගෙන රාජ්‍ය අංශයේ අනෙකුත් කාර්ය මණ්ඩල විසින් ද ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් වැඩි කරන ලෙස විවිධ ඉල්ලීම් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින් ද,

රාජ්‍ය ව්‍යවසායන්හි කාර්ය මණ්ඩල සඳහා වැටුප් හා දීමනා තීරණය කිරීමේදී එකී ආයතන විසින් උපයන ආදායම, ලාභය සහ රාජ්‍ය ආදායමට ලබාදෙන දායකත්වයට අවධානය යොමු කළ යුතු බව සැලකිල්ලට ගනිමින්ද,

තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව එතෙක් රාජ්‍ය සේවයෙහි පැවති 127 ක් පමණ වූ වැටුප් තල යාවත්කාලීන කොට සරල කිරීමේ අරමුණින් තනතුරු හා ශ්‍රේණීන් එකතු කොට සමස්ත වැටුප් තල 36 ක් යටතේ ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතීය හා ප්‍රාථමික ලෙස රාජ්‍ය සේවයේ මට්ටම් 04 ක් යටතේ වර්ගීකරණය කිරීම තුලින් විශේෂයෙන්ම දුම්රිය සේවය, තැපැල් සේවය, සෞඛ්‍ය සේවය වැනි විශාල සේවක සංඛ්‍යා වර්ගීකරණයක් තිබූ ක්ෂේත්‍ර වල වැටුප් තල සංඛ්‍යාව අඩු කිරීමේදී එම ක්ෂේත්‍ර වලට යම් අහිතකර බලපෑමක් සිදුවී ඇත්නම් ඒවා අධ්‍යයනය කර ඒ සඳහා විසඳුම් ලබාදිය යුතු බව සැලකිල්ලට ගනිමින් ද,

තවද, ඉහත කී සියළු තත්ත්වයන් මත සමස්ථ රාජ්‍ය සේවයෙහි වැටුප් හා දීමනා සම්බන්ධයෙන් නැවත සලකා බලා ඉතා ඉක්මනින් සුදුසු විසඳුම් ලබා නොදුනහොත් සමස්ත රාජ්‍ය සේවය තුළ වෘත්තීය ගැටළු වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස කාර්මික සාමය බිඳ වැටීම හා වැඩ වර්ජන ක්‍රියාත්මක වීම තුළින් ඉතා ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වී රටේ ජන ජීවිතයට හා සමස්ත සංවර්ධන ක්‍රියාවලියට අහිතකර බලපෑමක් ඇතිවීමේ අවදානමක් ඇති බව සැලකිල්ලට ගනිමින්ද,

මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයෙන්, එනම් ඃ

අ. රාජ්‍ය සේවයේ වැටුප් හා දීමනා සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන වැටුප් චක්‍රලේඛ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයට යෝජිත වැටුප් පරිමාණය ලබාදීමේ දී ඇතිවන බලපෑම් අධ්‍යයනය කිරීම සහ එහිදී මතුවන ගැටළු විසඳීම සඳහා ක්‍රමවේද යෝජනා කිරීම.

ආ. මෑතකදී වැටුප් හා දීමනා වැඩිකරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දුම්රිය සේවය, සෞඛ්‍ය, උසස් අධ්‍යාපන හා අධ්‍යාපන, තැපැල් සේවය යන ක්ෂේත්‍ර සඳහා දැනට ක්‍රියාත්මක වන වැටුප් චක්‍රලේඛ මගින් වැටුප් විෂමතාවයක් සිදු වී ඇති නම් එය අවම කිරීම සඳහා විසඳුම් යෝජනා කිරීම.

ඇ. දීපව්‍යාප්ත සේවාවන්ට අදාළ වැටුප් ගැටළු මෙන්ම කරනු ලැබ ඇති වැටුප් වැඩි කිරීම හේතුවෙන් දැනට පැන නැඟී ඇතැයි හඳුනාගෙන ඇති වැටුප් විෂමතාවයන් අවම කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඈ. සමාන වගකීම් දරන්නා වූ හෝ සමාන සුදුසුකම් සහිත වන්නා වූ හෝ වෘත්තිකයින් විසින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි දී ලබන්නා වූ වැටුප් හා වේතනයන් සහ දීමනා අතර ඇති විෂමතාවයන් අවම කිරීම පිණිස මග පෙන්වන වැටුප් හා වේතන ව්‍යුහයක් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

පිණිස රාජ්‍ය අංශයේ වැටුප් සමාලෝචනය සම්බන්ධයෙන් වන විශේෂ කොමිෂන් සභාවක් (මෙහි මින්මතු කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන) ස්ථාපනය කරලීම රජයේ අපේක්ෂාව වන හෙයින් ද,

ඉහතින් හඳුනාගෙන ඇති පරිදි, තත් කොමිෂන් සභාව වෙත පවරනු ලබන කාර්යයන් හා වගකීම් සපුරාලීම මහජන සුබසිද්ධිය උදෙසා වහාම ආරම්භ විය යුතු යැයි මා අදහස් කරන හෙයින් ද, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පූර්වෝක්ත කාර්යයන් හා වගකීම් භාරගෙන ඉටුකරලනු පිණිස 2018 අගෝස්තු මස 20 වන දින සිට මාස 02 ක කාල සීමාවක් සඳහා රාජ්‍ය අංශයේ වැටුප් සමාලෝචනය සම්බන්ධයෙන් වන විශේෂ කොමිෂන් සභාවක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මෙයින් පිහිටුවමි.

තවද, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි දැඩි විශ්වාසයෙන් යුතුව මෙමගින් පෙරකී,

1 එස්. රනුග්ගේ මැතිතුමා
2 කේ. එල්. එල්. විජේරත්න මැතිතුමා
3 ටී. පී. කොල්ලුරේ මැතිතුමා
4 සී. පී. සිරිවර්ධන මැතිතුමා
5 සුධර්මා කරුණාරත්න මැතිතුමිය
6 ජනක සුගතදාස මැතිතුමා
7 ධාරණී එස්. විජේතිලක මැතිතුමිය
8 ලලිත් ආර්. ද සිල්වා මැතිතුමා
9 ජී. එස්. එදිරිසිංහ මැතිතුමා
10 ඒ. ආර්. දේශප්‍රිය මැතිතුමා
11 බී. පී. පී. එස්. අබේගුණරත්න මැතිතුමිය
12 වෛද්‍ය පාලිත අබේකෝන් මැතිතුමා
13 පී. තංගමයිල් මැතිතුමා
14 එස්. ඩී. ජයකොඩි මැතිතුමා
15 එම්. සී. වික්‍රමසේකර මැතිතුමා

වන ඔබතුමන්ලා රාජ්‍ය අංශයේ වැටුප් සමාලෝචනය සම්බන්ධයෙන් වන විශේෂ කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් මවිසින් මෙයින් පත්කරනු ලබන අතර, ඉහත (අ) සිට (ඈ) දක්වා වන කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් මම ඔබට මෙයින් විධානය කරමි.

තවද, එස්. රනුග්ගේ මැතිතුමා ඉහත කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ද, එච්. ජී. සුමනසිංහ මැතිතුමා කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද මම මෙයින් පත්කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට කොමිෂන් සභාව වෙත මම මෙයින් බලය පවරමි.

තවද කොමිෂන් සභාව විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් තොරතුරු ලබාගනු පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් එම කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතුයැයිද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධාන කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහඅටක් වූ අගෝස්තු මස 20 වැනි දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.